# උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතිය
## දවුලගල - හන්දෙස්ස
# පුරප්පාඩු දැනුම් දීමයි

සී/ස උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතියේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 07/2025 චක්‍ර ලේඛනය අනුව සුදුසුකම් සපුරා ඇති මහනුවර දිස්ත්‍රික්කයේ පදිංචි අයවලුන්ගෙන් විවෘතව අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2026.09.02 සිට 2026.09.22 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **"ගරු සභාපති, සී/ස උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතිය – දවුලගල, හන්දෙස්ස"** යන ලිපිනයට එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ සමග අදාල සහතික වල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාල සහතික වල ඡායා පිටපත් සමග මෑතක දී ගත් චරිත සහතික 02 ක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් සහ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ද එවිය යුතු ය. සම්මුඛ පරීක්ෂණයට සියලුම සහතිකපත් වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රය සී/ස උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයෙන් වැඩ කරන දිනයන් වල දී ලබා ගත හැකිය.

දැනට විවිධ සේවා සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අයදුම්කරන්නේ නම් එම සමිතියේ මෑතක දී ගත් සේවා සහතිකයේ පිටපතක් සහ ඉල්ලුම් කරන තනතුරට ඔබව තෝරා ගත හොත් දැනට සේවය කරනු ලබන සමිතියෙන් නිදහස් කරන බවට සමිතියෙන් ලබා ගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත සමිතියේ සභාපතිතුමා මගින් නිර්දේශ කර එවිය යුතුය.

පහත සියලු තනතුරු තෝරා ගැනීමෙන් අනතුරුව ඇප මුදල් තැන්පත් කළ යුතුය.

## ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක III (පුරප්පාඩු තනතුරු 01)

වැ.ප. අංක - E.L.03.02

වැටුප් පරිමාණය - 37,680 - 605×10 -910×10 -1,210×10 = 64,930/-

වයස් සීමාව - 18 - 45

**සුදුසුකම් :**

අ. ග්‍රාමීය බැංකු කළමනාකාර තනතුරේ වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පොත් තබන්නා තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ කළමනාකරු 1 තනතුරක/ කළමනාකරු 2 තනතුරක/ ගිණුම් සහකාර 1 තනතුරක/ ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/බැංකු) 1 තනතුරක වසර 08 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ කළමනාකරු 3 තනතුරක/ ගිණුම් සහකාර 2 තනතුරක/ ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/බැංකු) 2 තනතුරක වසර 08 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ. සමුපකාර උසස් පෙළ සමත්වීම/ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය ඩිප්ලෝමාව/ පිළිගත් ආයතනයක මාස 09 ට නොඅඩු ගණකාධිකරණ ඩිප්ලෝමාව/ බැංකු හා මූල්‍ය කළමනාකරණය/ පිළිගත් ආයතනයක විගණනය පිළිබඳ ඩිප්ලෝමාව/ ඒ හා සමාන විභාගයකින් සමත්වීම සමග ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක/ පොත් තබන්නා තනතුරක වසර 01 ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පරිපාලක (වෙළඳසැල්) තනතුරක/ කළමනාකරු 1/ කළමනාකරු 2/ කළමනාකරු 3/ ගිණුම් සහකාර 1/ ගිණුම් සහකාර 2/ ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/බැංකු) 1, ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/බැංකු) 2 තනතුර වසර 02ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයක/ පිළිගත් ආයතනයක ගණකාධිකරණය/ වාණිජ කළමණාකරණය පිළිබඳ උපාධියක් සමත් වී තිබීම/ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය/ ව්‍යාපාර පරිපාලනය/ මානව සම්පත් කළමනාකරණය යන ඩිප්ලෝමාවන්ට අදාල වසර $2\frac{1}{2}$ ක පාඨමාලාවක් සමත් වී තිබීම.

**හෝ**

ඈ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර I (Charted Level I)/ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර III (A.A.T.Level III) සමත් වීම.

## අභ්‍යන්තර විගණක III (පුරප්පාඩු තනතුරු 01)

වැ.ප. අංක - E.L.03.01

වැටුප් පරිමාණය - 37,680 - 605×10 -910×10 -1,210×10 = 64,930/-

වයස් සීමාව - 18 - 45

**සුදුසුකම් :**

අ. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පොත් තබන්නා තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ කළමනාකරු (ව්‍යාපෘති)/ කළමනාකරු – I (ස.ණ.ස. සමිති) / වෙනත් මූල්‍ය ආයතන) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ. පිළිගත් ආයතනයක මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණය/ විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්වීම සමග ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක/ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක/ පොත් තබන්නා තනතුරක හෝ කළමනාකරු – I (ස.ණ.ස. සමිති/ වෙනත් මූල්‍ය ආයතන) වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ඇ. පිළිගත් විශ්වවිද්‍යාලයක/ පිළිගත් ආයතනයක ගණකාධිකරණය/ වාණිජ කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත්වී තිබීම/ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය/ ව්‍යාපාර පරිපාලනය/ මානව සම්පත් කළමනාකරණය යන ඩිප්ලෝමාවන්ට අදාල වසර $2\frac{1}{2}$ ක පාඨමාලාවක් සමත් වී තිබීම.

**හෝ**

ඈ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර I (Charted Level I)/ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර III (A.A.T.Level III) සමත් වීම.

**මෙයට - සමුපකාරික,**
**ගරු සභාපති.**
**සී/ස උඩුනුවර විවිධ සේවා සමුපකාර සමිතිය.**
**2026.09.02**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED